# චන්ද්‍රිකා එක්ක ඩීල් එකකට යන මිනිහෙකුට ඔලුවෙ අං 150 ක් තියෙන්න ඕන



**හිටපු අමාත්‍ය හා එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.බී. දිසානායක "ඉරුදින" ට ලබාදුන් විශේෂ සම්මුඛ සාකච්ඡාවේ මුල් කොටස පසුගිය සතියේ පළ විය. සම්මුඛ සාකච්ඡාවේ ඉතිරි කොටස මෙලෙස ප්‍රකාශයට පත් කරන්නෙමු.**

**පළමු කොටසෙන් හිරගෙදර අත්දැකීම් සවිස්තරාත්මක ලෙස විස්තර කළ ඔහු එම සාකච්ඡාවේ අවසාන අර්ධයේ දී මෙරට අනාගත දේශපාලනය පිළිබඳව විවාදාත්මක කරුණු රාශියක් විස්තර කළේය. ඔහුගේ එම වේගවත් අදහස් අප මෙලෙස ඉදිරිපත් කරන්නෙමු.**

**එහෙම නම් එම ජනාධිපතිවරණයට මොකද වෙන්නේ?**

ඇත්තටම චන්ද්‍රිකා මැතිනිය ජනාධිපතිවරණයකට නොගොසින් ජනමත විචාරණයකට ගියොත් එයාගේ පක්ෂයේ විශාල පිරිසක් බෙදෙනවා. විශාල පිරිසක් ජනමත විචාරණයට විරුද්ධ වෙලා එයාට විරුද්ධව හොරාට වැඩ කරනවා. මොකද මෙම ජනමත විචාරණය තියන්නේ චන්ද්‍රිකාට තවදුරටත් බලයේ ඉන්න. චන්ද්‍රිකා තවදුරටත් බලය තියාගෙන ඉන්නවට කැමැති පස්දෙනයි ඉන්නේ. අනුර, මංගල, කදිරගාමර්, රත්නසිරි හා චන්ද්‍රිකා පමණමයි. චන්ද්‍රිකා දිගටම ඉන්නවාට කැමැති. මීට අමතරව අර තංගල්ලේ මහින්ද අමරවීරත් දැන් මේ කණ්ඩායමට එකතුවෙලා ඉන්නවා. මෙම පක්ෂයේ අනිත් සියලු දෙනාම චන්ද්‍රිකා විශ්‍රාම යනවට කැමැතියි. මහින්ද රාජපක්ෂත් කැමැතියි චන්ද්‍රිකා විශ්‍රාම යනවට.

**ඔබේ විග්‍රහය අනුව මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ දේශපාලන අනාගතය කොහොම වෙයිද?**

මහින්ද මගේ හොඳ මිතුරෙක්. හැබැයි මහින්දට අනාගතයක් නැහැ. එහෙම වුණත් මහින්ද පක්ෂයෙන් කැඩෙන්නෙත් නැහැ. ඇත්තටම කිව්වොත් දැන් පක්ෂයේ උරුමය තියෙන්නේ අනුරට නෙමෙයි මහින්දට. මොකද මහින්ද තමයි පක්ෂයේ දිගටම හිටියේ.

ඒත් මහින්දට විපක්ෂ නායකකමවත් දුන්නේ නැහැනේ. ඒකත් මහින්ද උදුරා ගත්තා. අගමැතිකම වුණත් දුන්නේ නැහැ. ඒකත් මහින්ද උදුරලා ගත්තා. මහින්ද ජනාධිපති අපේක්ෂකත්වය උදුරලා ගත්තොත් එදාට බණ්ඩාරනායක දේශපාලනය ඉවරයි. ඒක බණ්ඩාරනායකලා දන්නවා. බණ්ඩාරනායකලා කවදාවත් පක්ෂයේ උරුමය නැතිකර ගන්නේ නැහැ. එමනිසා බැරිවෙලාවත් මහින්ද ජනාධිපතිධුර අපේක්ෂකත්වය උදුරලා ගත්තොත් එදාට මේ අය මහින්දව පරද්දන්න වැඩ කරනවා. එදාට මේ අය මහින්දව පරද්දවලා පක්ෂයේ අයිතිය තමන්ගේ අතේ තියාගන්නවා. කාටවත් එය නවත්වන්න බැහැ.

එහෙමත් නැත්නම් මෙයා මහින්ද වෙනුවට රත්නසිරි වගේ කෙනෙක් දාලා දිනාගෙන ආයෙත් බලයට එන්න බලයි. කීයටවත් චන්ද්‍රිකා විශ්‍රාම යන්න කැමැති නැහැ. මොන ඇජෙන්ඩා එක දැම්මත් ඒකේ අන්තිම පරමාර්ථය තමයි එයා බලයට එන්නේ කොහොමද කියන එක.

දැන් චන්ද්‍රිකා හදන්නේ රත්නසිරිව ජනාධිපති කරලා එයා අගමැති වෙලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ව්‍යවස්ථා සංශෝධනයකට ගිහිල්ලා විධායක අගමැතිවෙලා හැමදාම ඉන්න. හැබැයි මේ මොහොතේදී නම් එයා ව්‍යවස්ථා සංශෝධනයකට හෝ ජනමත විචාරණයකට යන්නේ නැහැ.

**ඔබ කොහොමද හරියටම එහෙම කියෙන්නේ?**

දැන් බලන්න මෙයා ළඟින්ම ඉන්න නියෝජ්‍ය අමාත්‍යවරු සමහර ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු මෙයා ළඟින්ම ඉන්නවා කියලා තමයි මෙයා හිතාගෙන ඉන්නේ. නමුත් ඒ අය මේ වෙනකොටත් රහසින් මහින්ද සමඟ එකතු වෙලා මෙයාව විශ්‍රාම යවන්න සැළසුම් කරනවා.

තනි ගැහැනියක් බලයේ ඉන්න තමයි මේ සේරම කරන්නේ. පක්ෂයේ බහුතරය විතරක් නෙමෙයි රටේ මධ්‍යස්ථ මිනිස්සුත් මේ තත්ත්වය පිළිකුල් කරනවා. එම නිසා පක්ෂයේ බහුතරය මහින්දට පක්ෂය දෙන්න හදනවා. ඒ වගේම පක්ෂය තේරුම් අරගෙන තියෙනවා චන්ද්‍රිකා පක්ෂයට රටට සමාජයට වාතයක්..... කරදරයක්... ශාපයක්.... හිරිහැරයක් කියලා.

අද මේ සුනාමි ප්‍රශ්නය ගත්තොත් මේක සම්පූර්ණයෙන්ම අනලා අවුල් වියවුල් කරලා තියෙන්නේ චන්ද්‍රිකා මැතිනිය. ඒකයි මම කියන්නේ චන්ද්‍රිකා වාතයක්.... ශාපයක්.... කරදරයක්.... හිරිහැරයක් කියලා.

අද අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තොත් වෙන කවරදාකවත් නැති ප්‍රශ්ණ ඇවිල්ලා, අවුල්වෙලා තියෙන්නේ වෙන කිසි දෙයක් නිසා නොවෙයි මේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය නිසා. චන්ද්‍රිකා දැන් එකක් කියනවා. ඊළඟ මොහොතේ තව එකක් කරනවා. ආයෙත් තව එකක් කියනවා ඊට හාත්පසින්ම වෙනස් එකක් කරනවා.

මම අහන්නේ... මොන බල්ලද මේ ගැනිට විදේශ ආධාර දෙන්නේ අර විදියට ජනාධිපතිවරු දෙදෙනෙක්ම "වේටිං රූම්" එකේ රස්තියාදු කරාම මේ ගැහැනිය මොන පාලිකාවක්ද කියලා ඒ මිනිස්දු දෙන්නා හිතන්නේ නැද්ද? ඒකයි මම කියන්නේ මෙයාට රටක් නෙමෙයි මරණාධාර සමිතියක්වත් භාර දෙන්න හොඳ නැහැ කියලා.

**අද ඔබ වේගයෙන් කථා කළත් පසුගිය කාලයේ නිහඬවෙලා හිටියා. ඇත්තටම චන්ද්‍රිකා මැතිනිය සමඟ "ඩීල්" එකක් නැති නම් කිසියම් ගනුදෙනුවක්වත් කරන්න හිතුණද?**

ඇත්තටම චන්ද්‍රිකා එක්ක ඩිල් එකකට යනවානම් ඒ මිනිහාගේ ඔලුවේ අං 150 ක් වත් තියෙන්න ඕන. වෙන කා එක්කවත් නොවෙයි චන්ද්‍රිකා එක්ක ඩීල් ගහනවා නම් තත්ත්වය ඒකයි. මෙයා එක්ක ඩීල් ගහපු ජනතා විමුක්ති පෙරමුණට වෙලා තියෙන දේ දැක්කම අර මුස්ලිම් කොන්ග්‍රසයේ මන්ත්‍රීවරයෙකුට අති විශාල මුදල් සම්භාරයක් දෙනවා කියලා ඒකෙන් දහයෙන් එකක්වත් ඒ මිනිහාට දෙන්නේ නැතිව ඒ මිනිහා අනාථ වෙලා ඉන්න හැටි දැක්කම... ඇත්තටම ඉතින් හිනායනවා. මොකද මේක තමයි චන්ද්‍රිකාගේ මනසේ ස්වභාවය. මේ මනසත් එක්ක මමවත් එක්සත් ජාතික පක්ෂයවත් රනිල් වික්‍රමසිංහවත් "ඩීල්" ගහන්න යන්නේ නැහැ.

හැබැයි ඉස්සර නම් රනිල් වික්‍රමසිංහ නායකතුමා චන්ද්‍රිකාව විශ්වාස කළා. චන්ද්‍රිකා ලෝකයට කියපු දේවල්. පාර්ලිමේන්තුව විසුරුවන්නේ නැහැ කියපු කථාන්දර එතුමා විශ්වාස කළා. මොකද ඒ කාලේ එතුමා හිතුවා එයාට වගේම මෙයාටත් මහත්මා දේශපාලන ගතිගුණ තියෙනවා කියලා. අද රනිල් වික්‍රමසිංහ නායකතුමාත් දන්නවා චන්ද්‍රිකා කවුද කියලා.

චන්ද්‍රිකාට මේ ප්‍රජාතන්ත්‍රවාදී ගතිගුණයක්වත්, මහත්මාකමක්වත්, සදාචාරයක්වත්, යුතුකම් ඉටු කිරීමේ ගුණාංගයක්වත්, සීලාචාරකමක්වත්, විලිලැජ්ජාවක් වත් වෙන කිසි ගුණයක් වත්... මේ මොකවත් නැහැ.

අනිත් එක චන්ද්‍රිකාට ඕනෑම කෙනෙකුට මොහොතක ඕනෑම බොරුවක් ඕනෑම මොහොතකදී කියන්න පුළුවන්. ඒ කියලා එම නිමේෂයේදීම එහෙම නෙමෙයි කියලත් චන්ද්‍රිකාට කියන්න පුළුවන්. මෙයා ඇරුනාම එහෙම කෙනෙක්ව මම මේ ලෝකේ දැකලා නැහැ. එම නිසා ඩීල් පිට ඩීල් ආවත් මගේ කාලය ඉවර කරන්න මම හිත හදාගෙන ඉන්නවා.

හැබැයි, ස්ථිර වශයෙන්ම ලබන ඔක්තෝබර් නොවැම්බර් වෙනකොට ඡන්දයක් එනවා, ඒ සඳහා වැඩකරන්න යාන්ත්‍රණයක් මම හදාගෙන තියෙනවා. මගේ පැත්තෙන් කරන්න ඕන දේ මම කරනවා. ඒ ශක්තිය මට තියෙනවා.

**ඔබ, ජනාධිපති චන්ද්‍රිකා සමඟ ගනුදෙනුවකට නොගියත් එම පාර්ශ්වයෙන් යම් නියෝජිත පිරිසක් ඔබව බලන්න ආවේ නැද්ද?**

නොයෙකුත් නියෝජිතයන් ආවා. කට්ටියක් මාව අරගෙන යන්න හැදුවා. තව කට්ටියක් අපේ අම්මව චන්ද්‍රිකා ලඟට අරගෙන යන්න හැදුවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර මැතිඇමතිවරු හොරෙනුත් ආවා මාව බලන්න. නමුත් චන්ද්‍රිකා කුමාරතුංග සමඟ ගනුදෙනුවකට යන්න කිසිසේත්ම ඉඩක් නැහැ කියන එක මං ගැන දන්න අය දන්නවා.

අද මම බොහොම සන්තෝෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ ඉන්නේ. හැබැයි පක්ෂයේ යම් යම් අඩුපාඩු තියෙනවා. තීරණ ගැනීමේ ප්‍රමාදයන් වැනි ප්‍රශ්න තියෙනවා. අසංවිධානාත්මක තත්ත්ව තියෙනවා. ඒවා හදාගෙන ඉදිරියට යන්න පුළුවන්.

**රනිල් වික්‍රමසිංහ නායකතුමා පසුගිය කාලේ ඔබව බලන්න ආවා. මොනවගේ කාරණාද සාකච්ඡා කෙරුවේ?**

එතුමාට මම කිව්වා ඉක්මණටම ආසන සංවිධායකයෝ පත් කරලා ඉවරකරන්න කියලා. දැනටමත් ප්‍රමාදයි. එසේම පක්ෂයට අනුබද්ධ සංවිධානවලත් තනතුරුවල තත්ත්වය ඒ වගෙයි. එයත් ප්‍රමාදයි. අපේ නායකතුමා මානුෂික විදියට තීරණය ගන්නවා. මම වගේ නම් තදබල තීන්දු අරගෙන මේක ඉවරයක් කරනවා. එතුමා එහෙම නැහැ.

දැන් අපි ඒ කාලේ නිමල් සිරිපාලව බදුල්ලටත්, පවිත්‍රාව කලවානටත් දැම්මේ බලෙන්. මොකද දිනන්න ඕන නිසා. ඒකයි මම නායකතුමාටත් කිව්වේ. සමහර දිස්ත්‍රික්ක හා ආසන පිළිබඳව පැහැදිලි තීරණයක් අරගන්න කියලා. මම මෙහෙම කියනවා කියලා සමහර අපේ ආසන සංවිධායකයෝ මට බැණ බැණ යනවලු. ඒකට ප්‍රශ්නයක් නැහැ. නමුත් මෙම ජනාධිපති ඡන්දේ හරිම තීරණාත්මකයි.

**ජනාධිපති ඡන්දයේදී ඔබේ පක්ෂයේ අපේක්ෂකයා රනිල්. සංධානයේ අපේක්ෂකයා ඔබ කියන විදියට මහින්ද හෝ රත්නසිරි. සටනේ ස්වභාවය කොහොම වෙයිද?**

මහින්ද එන්නේ නැහැ. මහින්ද ආවොත් චන්ද්‍රිකා මහින්දට විරුද්ධව වැඩ කරනවා. අනුර දිගට හරහට ගහනවා. අනිත් අතට රත්නසිරි දැම්මොත් දුර්වල අපේක්ෂකයෙක්. හැබැයි රත්නසිරිට රාජ්‍ය යාන්ත්‍රණය සම්පූර්ණයෙන් වැඩ කරනවා. ඒ අනුව මහින්දට රාජ්‍ය යාන්ත්‍රණයේ සහයෝගයක් ලැබෙන්නේ නැහැ. ඉහත කරුණු දෙකම ක්‍රියාත්මක කරවන්නේ චන්ද්‍රිකා. උතුර නැගෙනහිර ගත්තොත් මහින්දට එය අමාරු වෙනවා. හැබැයි රත්නසිරි ආවොත් චන්ද්‍රිකා උතුරු නැගෙනහිරට වැඩ කරලා ගන්න බලනවා. මේ තත්ත්වය තුළ රත්නසිරිවත් මහින්දවත් තරාදියකට දැම්මොත් එන්නේ එකම බර. දැන් සමහරු කියනවා මහින්ද ප්‍රබලයි කියලා. නමුත් ඇත්තටම වෙන දේ විග්‍රහ කරලා බලපුවාම ඒක එහෙම වෙන්නේ නැහැ.

මේ නිසා මේ දෙන්නාගෙන් කවුරු ආවත් රනිල් වික්‍රමසිංහ නායකතුමාට සමාන සටනක් දෙන්න වෙනවා. හැබැයි අපිට දිනන්න පුළුවන්. පසුගිය 2004 මහා මැතිවරණයේදී අපි අච්චර පැරදිලත් රනිල්ට 51.22% ක් තිබුණා. එතකොට සංධානයට 47% ක් හෙළ උරුමයට 2.5% ක් ලැබුණා. ඒ අර අන්තිම නරක වෙලාවේ තමයි අපිට අර විදියේ ප්‍රතිශතයක් ලැබුණේ. අද තත්ත්වය ඊට වඩා සෑහෙන්න වෙනස්.

අනිත් එක, මේ බලයයෙන් වියරු වෙලා අස්වාභාවික මානසික විකෘතියක් තියෙන අවස්ථාවක කවුරු සංධානයේ අපේක්ෂකයා වුණත් එය දෙපිලකට බෙදෙනවා. එක් පැත්තක් අක්‍රිය වෙනවා. රත්නසිරි ආවත්, මහින්ද ආවත් 50%ක් අක්‍රීය වෙනවා. මහින්දව කැපුණොත් මහින්ද ජනතාවට කියයි තමන්ට කරපු අසාධාරණය. ජනතාව පවා ඒක කියයි.

එම නිසා මම කියන්නේ කවුරු ආවත් ගැටලුවකින් තොරව අපිට දිනන්න පුළුවන්.

**නමුත් ආණ්ඩුවත් ජනප්‍රිය අයවැයක් ඉදිරිපත් කළා. උපාධිධාරීන්ට රස්සාත් දුන්නා. ආණ්ඩුවත් කරපු දෙයක් තියෙනවා නේද?**

කෝටි 60000 විතර අයවැයක් ඉදිරිපත් කළා. කෝටි 25000 විතර සොයාගත්තා. කෝටි 35000 ක විතර විශාල හිඟයක් තියෙනවා. මේ හිඟයට සල්ලි හොයාගන්න බැරිව දිගට හරහට පෞද්ගලිකරණය කරන්න පටන් අරගෙන තියෙනවා.

සුනාමි වැඩ සම්පූර්ණයෙන් අවුල් කරගෙන රාජ්‍ය නිලධාරීන් පවා කියනවා තවම 30% විතර තමයි වැඩ අවසන් කරලා තියෙන්නේ කියලා. අගමැතිම කියනවා මහපොළව පාගපු නැති එවුන් වැඩ කරන්න ආලා කියලා.

මේ සියලු තත්ත්ව එක්ක ඔය දීපු බජට් එකේ අවසානය වෙන්නේ මේ වසර ඉවර වෙනකොට රුපියල තවදුරටත් අවප්‍රමාණවෙලා ජීවන වියදම ඉහළ යාම. බලන්න නැද්ද කියලා. ජීවන වියදම 25%කින් ඉහළ යනවා. ඩොලර් එක රුපියල් 115ක් විතර වෙලා ලොකු උද්ධමනයකට රට ගමන් කරනවා. තව අවුරුදු හයකටවත් හදාගන්න බැරි විදියට මේ රටේ ආර්ථිකය මෙයා මේ වසර අවසන් වෙනකොට විනාශ කරලා දානවා.

**නමුත් රස්සා දීලා තියෙනවානේ?**

එයා රස්සා දෙනවා... එයා පත්වීම් දෙනවා. උසස් වීම් දෙනවා. නමුත් කල්පනා කරලා බලන්න හැම එකක්ම අවුල්නේ. ආර්ථිකය අවුල්, පෞද්ගලීකරණය නැත්නම් ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කරණය අවුල්. ඒ සියල්ල අස්සේ ඡන්දෙකට යන්න දිගට හරහට අරෙහන් මෙහෙන් සල්ලි අදිනවා.

සියලුම මන්ත්‍රීවරුන්ට ඇමැතිකම් දීලා එකෙක්ට වැඩක් කරගන්න බැහැ. උදලු තලේ එකෙක්ට දීලා මිට තවත් එකෙකුට දීලා. ඉතින් එකෙකුටවත් වැඩ කරගන්න බැහැ. පිඟාන එක තැනක, හාල් තව තැනක, මුට්ටි තවත් තැනක, හැන්ද එයා ළඟ... කිසි කෙනෙකුට වැඩ කරන්න බැහැ. අන්න එහෙම තමයි වැඩ කරන්නේ.සමහර අමාත්‍යවරුන් ඉන්නවා අමාත්‍යවරයා පමණයි ඉන්නේ. ඩෙස් එකක් බංකුවක්වත් අමාත්‍යාංශයට අයිති නැහැ.

අනික මේ චන්ද්‍රිකා හිතනවා එය වංචනික නිසා කැබිනට් එකේ සියලුම ඇමැතිවරු වංචනිකයි කියලා. ඉතින් එයා වැඩ කරන්නේ අමාත්‍යාංශ ලේකම්වරු එක්ක. ආචාර්ය අමුණුගම හිටියට චන්ද්‍රිකා වැඩ කරන්නේ පී.බී. ජයසුන්දරත් එක්ක. පවිත්‍රාට වචනයක් ඉදිරියට යන්න බැහැ අමාත්‍යාංශ ලේකම් හපන්ගමට ඉහළින්. ෆීලික්ස් පෙරේරා ප්‍රවාහන අමාත්‍යවරයාගේ තත්ත්වයත් ඒකයි. ජනතා විමුක්ති පෙරමුණ නම් එයාලට කැමැති අය ලේකම්වරුන් විදියට පත්කරගෙන ඉන්නවා නමුත් වැඩ කරන්න බැහැ.

උඩ ඉඳන් පහළටම අකාර්යක්ෂමතාවය, කේන්තිය, අසතුට, අප්‍රසන්න භාවය, දූෂණය, වංචාව, ප්‍රමාදය රජයනවා. මෙලොව දෙයක් සිද්ධ වෙන්නේ නැහැ.

දැන් උතුරේ ප්‍රශ්නේ ගත්තොත් ෆෙඩරල් ක්‍රමයක් යටතේ මෙය විසඳාගැනීමේ අවංක උවමනාවක් මෙයාට තියෙනවා. නමුත් හොඳටම එරිලා ඉන්නේ. මෙයා හිතන විදියට නෙමෙයි කදිරගාමර් හිතන්නේ. කදිරගාමර් හිතන විදියට තමයි ජවිපෙ හිතන්නේ. මෙයා එක තැනක ජවිපේ වෙනත් මතයක. එතනත් එරිලා.

එහෙම එරිලා තියෙද්දිත් මෙයා අර අවංක උත්සාහයෙ යෙදෙන අතර, ඒ අස්සේ වෙන වෙන ඩීලුත් ගහනවා. ඔය කරුණා හා හමුදාව එකතු කරලා ගහන්නේ එහෙම ඩීල් එකක්. එම නිසා කොයි වෙලාවේ නැවත යුද්ධය පටන් ගනීද කියලත් කියන්න බැහැ. මහා පුදුම අවුලක රට තියෙන්නේ.

**මීට වසර දෙකකට පෙරත් රට මේ වගේම අවුලකට ගියා නේද?**

ඒ වෙලාවෙත් රටේ ආර්ථිකය මේ විදියටම වැටුණා. රටේ ප්‍රශ්න මේ විදියටම අවුල් වුණා. ඒ මොහොතේ තමයි අපි මෙයාව ආලා ගියේ.

එදා ශත පහක් අතේ නැතුව මෙයා ජනාධිපති මන්දිරය හදන්න පටන් ගත්තා. ඔය මංගල, මිනිහගේ ඇමති කාර්යාලය ලක්ෂ 259 ක් වියදම් කරලා හැදුවා. නමුත් රට කරන්න සල්ලි නැහැ. කටුනායක අධිවේගී මාර්ගය හදන කොන්ත්‍රාත්තුව චීනයේ සුදුසුකම් ලත් 'රෙඩ් ආමි' කොම්පැනියෙන් උදුරලා අරගෙන 'කෙන්යාම්' කොම්පැනියට දුන්නා. රොනී පීරිස්ට පගාව ජරාව ගහන්න අවශ්‍ය නිසා. මේ චන්ද්‍රිකා කරපු වැඩ. මේ හැම ගණුදෙනුවක්ම සියලු විස්තර... ගත්තු කෙනා ගත්තු හැටි... ඔක්කොම විස්තර මා ළඟ තියෙනවා.

මට මතකයි ඔය කාලේම මෙයා මහජන බැංකුවෙන් 68%ක්, ලංකා බැංකුවෙන් 37%ක් සේවක අර්ථසාධකයෙන් 98%ක් ණය ගත්තා. ගිනි පොළියට ණය අරගෙන අරහෙට මෙහෙට කරකවලා අන්තිමට ආර්ථිකය ඍණ කළා.

අද ඊටත් වඩා භයානක විදියට සුනාමි ආධාරවලට අත තියලා තියෙනවා. ආණ්ඩුවේ අමාත්‍යවරුම කියනවා මෙයා වැඩ කරන්නේ නැහැ කියලා. ගාල්ල, මාතර, හම්බන්තොට විනාශ වුණා. උතුරු නැගෙනහිරත් බරපතල විදිහට විනාශ වුණා. තවම මෙයාට යාන්ත්‍රණයක් හදාගන්න බැරිවුණා උතුරු නැගෙනහිරට ආධාර සපයන්න. ඒක කරන්න ජවිපෙ මෙයාට ඉඩ දෙන්නේ නැහැ.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ පැහැදිලිවම තියෙනවා මහා අනතුරකින් පස්සේ, මහා ඛේදවාචකය පස්සේ කොහොමද අවතැන් වූවන් පදිංචි කරවන්නේ කියලා. ඒවා කිසිදෙයක් බලන්නේ නැතිව මෙයා මීටර 100ක් දාගෙන... මේ කරන්න හදන්නේ ඔලුව උඩින් බුල්ඩෝසර් යවන වැඩ.

අම්මා... තාත්තා නැතුව දරු පවුල් නැතුව මිනිස්සු අනාථවෙලා ඉන්නවා. මෙයා ඒ මිනිස්සුන්ගේ ඔලුව උඩින් බුල්ඩෝසර් යවන්න හදනවා.

එහෙත් වැඩ කරන්නේ නැහැ කියලා 'එන්ජීඕ' වලට බැනලා දැන් රාජ්‍ය නොවන සංවිධානවලට සල්ලි එවන ක්‍රමත් අහුරන්න යනවා.

මෙයා මේ කරන අවුල මෙයාට එරෙහිව තියෙන කේන්තිය, වෛරය, අප්‍රසන්නකම දැනටමත් වැඩිවෙලා. එම වෛරය මේ අවුල කොයි වෙලාවක හරි පුපුරවලා යනවා. එහෙම පිපිරෙන්න කලින් මෙයා ඡන්දයකට යනවා. කිසිම සැකයක් නැහැ මේ ඉරහඳ පායනව වගේ මේ ඔක්තෝබර් නොවැම්බර් මුල වෙනකොට මෙයා ඡන්දයකට යනවා.

මම හිතන්නේ එතකොට මේ චන්ද්‍රිකාගේ කතාව ඉතාම අවාසනාවන්ත විදිහට අවසාන වේවි.

**එතකොට ජනතා විමුක්ති පෙරමුණට මොකද වෙන්නේ?**

ජනතා විමුක්ති පෙරමුණේ අය මාව හමුවෙන්නත් ආවා. මම ඒ අයට උපදෙස් දුන්නා මේ වෙලාවේ හැටියට ජවිපෙ මම හිටියත් කරන්නේ එල්ලිලා ඉන්න එක කියලා. 1956 දී පිලිප්ලා හිතුවෙ අපිට මල් බණ්ඩාරනායකට ගල් කියලා. හැබැයි ගල් මල් අසූචි ඔක්කොම ආවේ පිලිප්ට. 70 සමගි පෙරමුණ වෙලාවේ එන්.එම්. ලා කොල්වින් ලා හිතුවේත් අපිට මල් මැතිනියට ගල් කියලා. නමුත් ගල් මල් අසූචි ඔක්කොම ආවේ ඇන්.එම්. ලාට කොල්වින්ලාට. එදා වම කොච්චර වේගයෙන් පහළට බැස්සාද කිව්වොත් 1977 මහා මැතිවරණයෙන් සමසමාජ කොමියුනිස්ට් සියලුම අපේක්ෂකයෝ පැරදුනා. මමත් තරඟ කළා මමත් පැරදුනා.

**ඉතින් මොකක්ද හිතන්නේ?**

ජවිපෙත් අර පරණ විදියටම හිතනවා චන්ද්‍රිකාට ගල්-අපිට මල් කියලා. හැබැයි මිනිස්සු බලාගෙන ඉන්නේ ජවිපෙ කරන්නේ මොකක්ද කියලා. මොකද මිනිස්සු විශ්වාසය තිබ්බේ ජනතා විමුක්ති පෙරමුණ ගැන.

ලෙනින් විප්ලවය කරනකොට පක්ෂ රැස්වීම්වල කතා කෙරුනු යථාර්ථය ජනතාවට කිව්වේ නැහැ. ලෙනින් කිව්වේ ගොවියන්ට- ඉඩම්! හමුදාවන්ට සාමය! කම්කරුවන්ට පාන්! කියලා.

රදළ කුලැක්වරුන් සතුව ඉඩම් තිබුණ හින්දා ලෙනින් ගොවියන්ට ඉඩම් දෙන්න පොරොන්දු වුණා. පළවෙනි ලෝක යුද්ධයේදී 'සාර්' මෙහෙයවපු සටන් නිසා හමුදාව හෙම්බත් වෙලා හිටියේ. එම නිසා ලෙනින් කිව්වා හමුදාවට සාමය කියලා. කම්කරුවන්ට ලොකු ආහාර ප්‍රශ්නයක් තිබ්බා. එම නිසා ඒ අයට පාන් දෙනවා කිව්වා. දැන් ජනතා විමුක්ති පෙරමුණ මොකක්ද කිව්වේ. ලෙනින් කිව්වා වගේම ජනතා විමුක්ති පෙරමුණ ජනතාවට කිව්වා පොහොර රුපියල් 350ට දෙනවා කියලා. හාල් නිකම් දෙනවා කිව්වා. 60000 රස්සා දෙනවා කිව්වා. වැව් හදනවා කිව්වා. ගොවියාගෙන් වී රුපියල් 16.50ට මිළදී ගන්නවා කිව්වා. 70%කින් පඩි වැඩි කරනවා කිව්වා. පෞද්ගලීකරණය නවත්වනවා කිව්වා. නමුත් අද මේ කිසි දෙයක් කරගන්න බැරිවෙලා තියෙනවා. අඩුම තරමේ මේ එක ප්‍රශ්නයක්වත් විසඳගන්න බැරිවෙලා තියෙනවා.

මේ රටේ ගොවියන්ගෙන් 65%කට ඉඩම් අයිතිය හරියට ලැබිලා නැහැ. එක් ගොවියෙකුට හරියට ඉඩමක් දෙන්න බැරිවෙලා තියෙනවා, මේ කෘෂිකර්ම හා ඉඩම් ඇමැති අනුර දිසානායකට.

මම කෘෂිකර්ම ඇමැති විදියට එදා කරපු දියර කිරි ව්‍යාපෘති, ගෝකුල ගම්මාන, පළතුරු ගම්මාන, සත්ත්ව නිෂ්පාදන කෘෂි උද්‍යාන ඒ සියලුම දේ නවත්වලා කෘෂිකර්ම අමාත්‍යාංශය පිස්සන් කොටුවක් කරලා තියෙනවා.

මම වෙන්කරපු මුදල් වලින් 30%ක් පමණයි මෙයා පාවිච්චි කරලා තියෙන්නේ. ඉතිරි 70% එලෙසම ඉතිරි වෙලා තියෙනවා.

එකක් මේ අයට ඉංග්‍රීසියෙන් වාර්තා කියන්න බැහැ. දන්න කාගේ හරි උපදෙස් ගන්නෙත් නැහැ. සම්පූර්ණ අර්බුදයක්.

ජවිපෙ ධීවර ඇමති ගත්තොත් මුලු ධීවර කර්මාන්තයම කනවා. එදා මහින්ද විජේසේකරට හොඳ දැනුමක් තිබ්බා. ධීවර කර්මාන්තය ගැන. මේ ඇමැතිට එහෙම එකක් නැහැ.

දැන් සුනාමිය ගත්තත් ඉඩම් ප්‍රශ්නේ ගත්තත්, රස්සා ප්‍රශ්නේ ගත්තත්, පොහොර ප්‍රශ්නේ ගත්තත් හැම දෙයක් ගැනම අන්තිමට චෝදනාවට ඉලක්ක වෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ.

ගමේ ජනතා විමුක්ති පෙරමුණේ කාඩර්වරු මහා එඩිතරකමකින් පපුව පුම්බාගෙන ඉන්නකොට ජවිපෙ මන්ත්‍රීවරු ඇමැතිවරු චන්ද්‍රිකා ඉදිරියේ දනගහලා, බඩගාලා, ලෙවකාලා... හෙලුවෙන් පෙරෙළෙනවා. දැන් ගමේ නගරයේ කාඩර්වරුන්ට මේක දැකලා විලිලැජ්ජයි. දෙයියනේ... මෙච්චර නිවටයෝද කියලා හිතලා මේ කාඩර්වරු අන්ත අසරණ වෙලා ඉන්නේ.

ලබන ඡන්දයේදී ජනතා විමුක්ති පෙරමුණ නැවතත් ආසන 19 අඩුවෙනවා. තව අවුරුදු දෙකක් ගියොත් ඒකත් නැතිවෙනවා.

වසර 1970 දී පාර්ලිමේන්තුවේ ආසන 146 ක් තිබුනා. ආසන ක්‍රමය අනුව සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂයට ආසන 26 ක් හිමිවුණා. මතක තියාගන්න ඒ ආසන ක්‍රමය යටතේ.

අද පාර්ලිමේන්තුවේ ආසන 225 ක් තියෙනවා. සමානුපාතික ක්‍රමය යටතේ ආසන 39 ක් ජනතා විමුක්ති පෙරමුණට තියෙනවා. මතක තියාගන්න ඒ සමානුපාතික ක්‍රමය යටතේ. එහෙම බලපුවාම 2004 ජවිපෙට වඩා 1970 සමසමාජ කොමියුනිස්ට් පක්ෂ බලවත්. හැබැයි 1977 දී ඒ බලවත් පක්ෂ දෙක ආසන බින්දුවට (0) වැටුණා. එහෙම නම් ජවිපෙ බින්දුවට වැටෙන එක ප්‍රශ්නයක් නෙවෙයි.

ඉදිරි ජනාධිපතිවරණයෙන් කවුරු දින්නත් ඊට පස්සේ මහ මැතිවරණයක් එනවා. ඒ කියන්නේ ළඟ ළඟ මැතිවරණ දෙකක් එනවා. ඒ දෙකටම ජවිපෙට මුහුණ දෙන්න වෙනවා. තව අවුරුදු තුනක් හතරක් යනකොට නැවතත් ආසන ක්‍රමයට යන්න වෙනවා. එතැනදී මේ අයට එකම එක් ආසනයක් වත් ලැබෙන්නේ නැහැ.

සුදුම සුදු කමීස ඇඳගත් කිරිකොක්කු වගේ ජවිපෙ මැති ඇමතිවරු අද ඇඟ හැමතැනම පැල්ලම් ගාගෙන. අද මේ අයගේ ගෙවල් ගැන, වාහන ගැන, ගර්ල් ෆ්‍රෙන්ඩ්ලා (Girl Friends) ගැන, සර්කිට් බන්ගලෝවල හිටපු එවා ගැන, පිටරට ගියා ඒවා ගැන, එක්ලක්ෂ පනස්දහසේ ජංගම දුරකථන ගැන.......මේ සේරම පැල්ලං අර කිරිකොක්කු වගේ හිටපු අයට වැදිලා.

අවසානයේදී මේ සිද්ධියේ මෙම දේශපාලන අර්බුදයේ අභාග්‍ය සම්පන්න කණ්ඩායම බවට ජනතා විමුක්ති පෙරමුණ පත්වෙනවා. ඒක වළක්වන්න බැහැ.

**අවසාන වශයෙන් ඔබට මේ තීන්දුව දුන් මේ රටේ අග විනිසුරුවරයා ගැන මොකද හිතෙන්නේ?**

අග විනිසුරුතුමා ඇත්තටම දේශපාලනඥයෙක් විදියට තමයි හැසිරෙන්නේ. එයාගේ ජීවිතයේ මර්මස්ථානවලින් එයා පුදුම විදියට ගැලවී ගැලවී ඉස්සරහට ආවා.

දැන් දමයන්තිගේ ප්‍රශ්නය ගත්තොත්, ඒ කියන්නේ ජයසේකර ගේ නෝනව ......... එම නෝනත් එක්ක අනාචාරයේ හැසිරීමේ කථාව ගත්තොත් එම නඩුවේ දික්කසාදය දුන්න විනිසුරුට එරෙහිව අධි චෝදනා පත්‍රයක් යැව්වා. මෙරට ශ්‍රේෂ්ඨාධිකරණය, එම දික්කසාද තීන්දුවට එරෙහි පෙත්සම විභාග කෙරුවේ මාක් ප්‍රනාන්දු, තිස්ස බණ්ඩාරනායක හා වෙනත් විනිසුරුවෙක්. ශ්‍රේෂ්ඨාධිකරණය අදාළ විනිසුරුවාගෙන් අදාළ මස 12 වැනිදා උත්තර කැඳෙව්වා නම් එම මාසයේම 7 වැනිදා සරත් එන්. සිල්වා නීතිපති වුණා. එම ප්‍රශ්නය එතනින් ඉවර වුණා.

ඊට පස්සේ වික්ටර් අයිවන් මෙයාට විරුදධව චෝදනා 29 ක් ගොනු කරලා මෙතුමාට විරුද්ධව පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කළා. එම පෙත්සමේ තියෙනවා මෙයා මෙරට අධිකරණ පද්ධතියට කරපු අපහාස. නීතිඥ වෘත්තීයෙන් පවා මෙයාව නෙරපා හරින්න කියලා. එම පෙත්සම විභාග වෙන්න තියෙද්දී මෙයා අගවිනිසුරු බවට පත් වුණා. එම පෙත්සමත් එතනින් අවසාන වුණා.

මට ඇතැම් කාරණා ඔප්පු කරන්න අමාරුයි. නීතිඥයෝ වුණත් මෙම තත්ත්වය යටතේ ඉදිරිපත් වෙන්න භයයි. මගේ කථාවේ වුණත් ඇත්ත තත්ත්වය ඒකයි. නමුත් කවදා හරි මෙම නීතිඥයෝ මෙම කථාන්තර හෙළි කරයි.

පක්ෂ මාරු කිරීමේ නඩු තීන්දු, බදු සමා පනත වගේ තීන්දු දැක්කහම හිතෙන්නේ මේවා දේශපාලන තීන්දු කියලා.

සමහර විනිසුරුවන්ට ප්‍රේම සම්බන්ධතා නිසා එලවලා තියෙනවා. අල්ලස් දූෂණ චෝදනා තියෙන අය නිදහස් වෙලා තියෙනවා. මේවා සිද්ධ වුණේ මෙම අග්‍ර විනිශ්චයකාරතුමාගේ කාල සීමාව තුළ. මගේ තීන්දුව වුණත් එක්කෝ බරපතල වැරදීමක්. නැත්නම් ඉතින් දේශපාලන තීන්දුවක්. කවදා හරි මේ තීන්දු නිවැරදි කරන්න වෙනවා. නැත්නම් අනාගතයේදී මෙම තීන්දු උපුටා දක්වලා මුලු නීති ක්ෂේත්‍රයම විශාල අනතුරකට යයි. එහෙම වුණොත් මෙම වැරදි තීන්දු අනාගතයේදී නීතිය බවට පත් වෙයි.

**ඉතින් ඒක වළක්වන්න වැඩපිළිවෙළක් නැද්ද?**

ඒක තමයි මම කියන්නේ. දැන් බලන්න දියවන්නා ප්‍රේම වෘතාන්තය සම්පූර්ණයෙන් යට ගැසුවා. ඕන බබෙක් මේ කථාව දන්නවා. මේවා එළියට ගන්න වෙනවා.

මම හිතනවා ඒ ශක්තිය මට තියෙනවා කියලා. මම විශ්වාස කරනවා මේ රටේ මිනිස්සු ඒක කරන්න අපිට බලය දෙයි කියලා. එම බලය ලැබුණු විගස කිසිදු ප්‍රමාදයකින් තොරව එම තත්ත්වය නිවැරදි කරන්න අප කටයුතු කරනවා. කිසිම වෛරයක් නැහැ. හැබැයි මේ නිවැරදි කිරීම කරනවා. එච්චරයි.

**ඒ කියන්නේ ඇත්තටම.......වෛරයක් නැහැ......**

ඇත්ත වශයෙන්ම මට එහෙම වෛරයක් නැහැ. මට අර පළමු දවස් දෙක තුන ඇතුළත තිබුණු වෛරය අද නැහැ. කිසිම කේන්තියකුත් නැහැ.

චන්ද්‍රිකා ගැන හිතුවොත් එයාව පක්ෂයට ගන්න, අනුරව එළියට දාන්න, පක්ෂ නායක කම දෙන්න, මහා ඇමති කරන්න, අගමැති කරන්න, ජනාධිපති කරන්න සුවිශාල වැඩ කොටසක් මම කළා. හැමෝම ඒක දන්නවා. නමුත් මට ඇමැතිකම් ලැබුණේ දයාව අනුකම්පාව උරුමය නිසා නෙමෙයි. මගේ දක්ෂකමට.

හැබැයි පක්ෂයේ මහලේකම් කම නම් චන්ද්‍රිකා මට දුන්නා. මම හිතන්නේ එයා මට ඊටත් වඩා ලොකු දෙයක් දුන්නා. ඒ තමයි මේ හිරදඬුවම. අද මම අත්දැකීම් බහුල වඩාත් පිරිපුන් දේශපාලනඥයෙක් විදියට තව තවත් ගොඩ නැඟෙනවා.

හිරගෙදර අපි සියයකට පමණ යන්න තියෙන්නේ එක වැසිකිලියයි. රෑට මදුරුවෝ, කූඹි කනවා. නිදාගන්න තැන වටේට ලාම්පු තෙල් දැම්මත් ලාම්පු තෙල් වේලුනම ආයෙත් කූඹි කනවා. මදුරුවන්ට කොයිල් පත්තු කරනවා.

දවල්ට කාලා චුට්ටක් ඇහැ පියාගන්නකොට හෝ ගාලා මැස්සෝ වහනවා. රෙද්ද පොරවා ගන්න බැහැ දාඩිය දමනවා. මේක ඇතුලේ එම පීඩාව අඩු වැඩි වශයෙන් සැරින් සැරේ විඳිනවා. හැබැයි මම අත්දැකීම් බහුල පරිණත දේශපාලනඥයෙක් විදියට දවසින් දවස ජනතාවගේ ආදරයට, ගෞරවයට, කරුණාවට භාජනය වෙනවා. එහෙම බලාගෙන ගියාම මාව හිරේට දාපු එක ගැන චන්ද්‍රිකා මැතිනිය වගේ මාත් අද සතුටු වෙනවා.